# දැන් තහංචි පනවා ඇති ජාන වෙනස් කළ ආහාර

ජාන ප්‍රතිසම්බන්ධන තාක්ෂණය භාවිතා කරමින් ජාන වෙනස්කමකට භාජනය කළ ආහාර ද්‍රව්‍ය ගෙන්වීම හා අලෙවිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තහනම් කරනු ලැබ ඇත.

මෙම නීතිය ක්‍රියාත්මක වූයේ 2001 මැයි මස පළමු වැනිදා සිට ය. මේ යටතේ කිසිදු පුද්ගලයකු විසින් ඩී. එන්. ඒ. ප්‍රතිසම්බන්ධන තාක්ෂණය භාවිතා කරමින් කුමන ආකාරයක හෝ ජාන වෙනස් කිරීමකට භාජනය කළ අමු හෝ පිරිමැසුම් කළ ආහාර ආනයනය කිරීම වාණිජ කටයුතු සඳහා නිෂ්පාදන කිරීම ප්‍රවාහනයට ගබඩා කිරීම බෙදා හැරීම විකිණීම හා විකිණීමට ඉදිරිපත් නොකළ යුතු ය.

පහත දැක්වෙන ආහාර වර්ග ආනයනය කරන්නේ නම් ඒවා ජාන වෙනස් කිරීමකට බඳුන් නොකළ බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එසේ නොමැතිව ආනයනය කිරීම තහනම් ය.

1. පූර්ණ සෝයා බෝංචි
2. සෝයා පිටි
3. මේදය ඉවත් කළ සෝයා පිටි
4. සෝයා කැටි/දළ එළවළු ප්‍රෝටීන් (ටී.වී.පී.)
5. සෝයා කිරි
6. සෝයා සෝස්
7. ආහාර මිශ්‍රණ වශයෙන් සෝයා බෝංචිවලින් නිපදවා ගත් දෑ අන්තර්ගත අනෙකුත් ආහාර නිෂ්පාදන
8. ඉරිඟු/බඩ ඉරිඟු
9. ඉරිඟු පිටි/ බඩ ඉරිඟු පිටි
10. ඉරිඟු පිටි/බඩ ඉරිඟු පිටි අඩංගු අනෙකුත් නිෂ්පාදන
11. තැවුම් තක්කාලි
12. පොඩි කරන ලද තක්කාලි (ප්‍යූරි)
13. තක්කාලි ආලේප (පේස්ට්)
14. තක්කාලි කෙචප්
15. තක්කාලි සෝස්
16. තක්කාලි මුල් කොටගත් අනෙකුත් ආහාර නිෂ්පාදන
17. චීස්
18. අර්තාපල් සහ අර්තාපල් අන්තර්ගත නිෂ්පාදන
19. බේකරි යීස්ට් හා මද්‍යසාර සඳහා යොදා ගන්නා යීස්ට්
20. බීට් සීනි
21. ආහාර සඳහා යෙදා ගන්නා මුහුන්

සරලව සඳහන් කළහොත් තහනම් වන්නේ ජාන විද්‍යාත්මකව නවීකරණය කරන ලද ආහාරයන් ය. ජාන විද්‍යාත්මකව සකස් කරන ලද ආහාර යනු ජාන ඉංජිනේරු විද්‍යාත්මකව සකස් කර ගන්නා ලද ද්‍රව්‍ය අඩංගු හෝ ඒවා සමග නිෂ්පාදනය කරන ලද ආහාරය.

ජාන ඉංජිනේරු විද්‍යාත්මකව සකසන ලද ද්‍රව්‍ය ලෙස අදහස් කෙරෙන්නේ ජාන ඉංජිනේරු විද්‍යාත්මකව සකසන ලද ජීව වස්තූන් වෙතින් ප්‍රභවය කොට ගන්නා ලද එසේ ම ජීව වස්තුවේ වෙනස් කරන ලද අණුක හෝ කෝෂ සංයුක්ත නෛසර්ගිකතාවන්, ද්‍රව්‍ය තුළින් සොයා ගැනීම නොසලකා හරින ලද ද්‍රව්‍ය යන්න ය .

ජාන ඉංජිනේරු විද්‍යාත්මකව සකසන ලද ජීව වස්තූන් යනු අභිජනනය, ප්‍රතිබද්ධකරණය, පැසවීම, තාලක සංසේචනය මගින් දෙමුහුන් කිරීම, පටක රෝපණය යන ක්‍රම හැර ස්වභාවික තත්ත්ව යටතේ වෙනස් කිරීමට හැකියාව නැති ජීව වස්තුවකි.

මේ පිළිබඳ නීතිය නිකුත් කරන ලද්දේ 2001 අප්‍රේල් 6 වැනිදා පළ වූ අතිවිශේෂ ගැසට් පත්‍රයෙනි. ❑